# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/4 - 2018 ඔක්තෝබර් මස 01 වැනි සඳුදා - 2018.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පී. වී. 66705 දරන කාට්සු - හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2016 අප්‍රේල් මස 08 වැනි දින අංක 1961/34 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයේ උපලේඛනය, එහි II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''හිණුම්කරණ කළමනාකරණ ගෞරව උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් කොට මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**I උපලේඛනය**

***කොන්දේසි***

කාට්සු - හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රෙනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපන ගෞරව උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කොට ගැනීමේ දී අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ සංකලන ගණිතය හෝ උසස් ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ගණිතය යන විෂයයන් අතරින් කවර හෝ විෂය තුනකට 'S' (සාමාන්‍ය) සාමාර්ථ එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

**II උපලේඛනය**

| *I වන තීරය*<br><br>*උපාධිය* | *II වන තීරය*<br><br>*උපාධිය සඳහා කෙටි යෙදුම* |
|---|---|
| භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඊඩී ගෞරව (භෞතීය විද්‍යා) |

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10 - 439

1A - PG 4253 — 507 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*